# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2157/5 - 2020 ජනවාරි මස 06 වැනි සඳුදා - 2020.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (1) ව්‍යවස්ථාව යටතේ පත්කරන ලද සංචාරක ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා සඳහා විෂයයන් හා කාර්යයන් පැවරීම මෙහි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි වහාම ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
සංචාරක හා ගුවන් සේවා අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 31 වැනි දින.

**උපලේඛනය**

**ගරු අරුන්දික ප්‍රනාන්දු, සංචාරක ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්* |
|---|---|---|
| 1. ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය මතු කරමින් ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම. | 1. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය.<br>2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය. | • සංචාරක පනත (2005 අංක 38) |

1A - G 31756 — 377 (2020/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**ගරු අරුන්දික ප්‍රනාන්දු, සංචාරක ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්* |
|---|---|---|
| 2. සංචාරක නියෝජිතායතන ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු | 3. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | |
| 3. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය, ප්‍රෞඪ ඓතිහාසික උරුමයයන්, පරිසරය, දේශගුණික විවිධත්වය, සයුරු වෙරළ සම්පත් ආදිය මතු කරමින් සුවිශේෂිත සංචාරක දිවයිනක් ලෙස සංචාරකයින්ගේ නිවාඩු නිකේතනයන් හා විනෝදාත්මක සහසුකම් සැපයීමට අදාළ ජාත්‍යන්තරව පිළිගත් හෝටල් සහසුකම්, ගුවන් හා මුහුදු ගමන් සහසුකම් ප්‍රවර්ධනය කිරීම. | 4. ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන කාර්යාංශය. | |

01 - 531

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.